UEA
Universala Esperanto-Asocio

# එස්පෙරාන්තෝ දිනය

## 2018 ජූලි 26 වන දින



## භාෂා සාධාරණත්වය

ඒස්පෙරාන්තෝ ඉගෙන ගන්න:
**www.lernu.net**

භාෂාවන් ගැන තොරතුරු: www.lingvo.info
අන්තර්වාර්ගික සන්නිවේදනය ගැන: www.esperanto.net | www.uea.org

| ජූලි 26,<br>එස්පෙරාන්තො දිනය | 26-a de julio<br>Esperanto-Tago |
|---|---|








**ජූලි 26 - එස්පෙරාන්තො දිනය නොහොත් භාෂා සාධාරණත්වයේ දිනය**
**එස්පෙරාන්තො දිනය යනු කුමක් ද? එය ලොවට වැදගත් වන්නේ ඇයි?**

1887 වසරේ ජූලි 26 වැනි දින එස්පෙරාන්තො බසේ මුල් පොත (එස්පෙරාන්තො භාෂාව ගැන ප්‍රථම හඳුන්වා දීමේ ව්‍යාකරණය) ප්‍රකාශයට පත් විය. විවිධ භාෂා කතා කරන ජනතාවට එකිනෙකා හා අදහස් හුවමාරු කිරීමට සම වේදිකාවක් වීම මෙම මධ්‍යස්ථ බසේ අරමුණ විය. කතා කරන භාෂාව නිසා යමෙක් වඩා වැදගත් යයි සැලකීම යුක්ති සහගත නොවේ.

• ***ජූලි 26වැනි දින භාෂා සාධාරණත්වයේ දිනය ලෙස සමරමු යයි අපි ලෝකයට යෝජනා කර සිටිමු. එම භාෂා සාධාරණත්වය තුළින් සාධාරණ අන්තර් සංස්කෘතික-ජාතික-වාර්ගික සබඳතාවන් යතාර්ථයක් කර ගනිමු***

සුළුතර භාෂාවන් නොසලකා හැරීමෙන් සිදුවන්නේ එම භාෂා කතා කරන ජනතාව කොන් වී යාමත් සමාජ ආර්ථික විෂමතාවන් තව තවත් පුළුල් වීමත් ය.

බහුතරයකගේ භාෂාව වීම නිසා යමෙක් තම මව් භාෂාව ම භාවිත කරමින් ප්‍රතිලාභ භුක්ති විඳින විට සුළුතර භාෂකයෙක් එම ප්‍රතිලාභවලට පිවිසීමට සිය මව් බස පසෙක ලා බහුතරයේ භාෂාව ඉගෙන ගැනීමට අමුතුවෙන් වෙර දැරිය යුතු නම් එතැන භාෂා සාධාරණත්වයක් නොමැති බව කිව යුතු ය.

බහුභාෂා ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමෙන් වඩා පුළුල් පිරිසකට විවිධ අවස්ථා සඳහා දොරගුළු විවර වන බව පසක් වූ සත්‍යයකි. සාධාරණ සන්නිවේදනයක් උදෙසා යුනෙස්කෝ (UNESCO) සංවිධානය ත්‍රෛභාෂා ප්‍රතිපත්තියක් ද එම භාෂා ප්‍රවර්ග තුනට අදාළ භාෂා හඳුනාගෙන ඒවාට නිසි තැන දීම ද උගැන්වීම ද රාජ්‍යයන්ට නිර්දේශ කරයි.

• මව් භාෂාව - තම මව් බසින් අධ්‍යාපනය ලැබීම සියළු දෙනාගේ ම අයිතිවාසිකමකි.

• කලාපීය භාෂාව - පෙරදිග අප්‍රිකානු රටවල ස්වාහීලි වැනි කලාපයක් එකට බැඳ තබන කලාපයකට අනන්‍ය වූ භාෂාව

• අන්තර්ජාතික භාෂාව - විශ්ව ගම්මානයක් බවට පත් වී ඇති ලෝකයේ සියළු ම ජනතාවට සම වේදිකාවක සිට සන්නිවේදනයේ යෙදීමට මධ්‍යස්ථ භාෂාවක්

අන්තර්ජාතික භාෂාව මධ්‍යස්ථ වීම බහුසංස්කෘතික ලෝකයක අවශ්‍යතාවකි. ස්වකීය මව්බස රැක ගනිමින් මධ්‍යස්ථ භාෂාවකින් අන්තර්ජාතික සන්නිවේදනයේ යෙදීම යථාර්තයක් කරන මෙවලමකි, එස්පෙරාන්තො භාෂාව.

*«ලෝකයේ නිර්මිත භාෂා අතුරින් අද වන විට වඩාත් ප්‍රචලිත, වඩාත් භාවිත භාෂාව එස්පෙරාන්තො ය. මිනිසා දැනට වඩා බැරෑරුම් ලෙස සලකා බලන්නේ නම් එස්පෙරාන්තො බසින් සාක්ෂාත් කර ගත හැකි ප්‍රතිඵල සමුදායකි... එස්පෙරාන්තො බස ඉගෙන ගැනීමට අවශ්‍ය වන කාලය, ව්‍යාකරණ රීති, තර්කානුකූල වීම හා විසමතා ව්‍යතිරේඛ නොමැති වීම, ඕනෑ ම සංකීර්ණ අදහසක් ප්‍රකාශ කිරීමට යෝග්‍ය අති සරල භාෂාවක් වීම මෙම භාෂාව සතු විශේෂ ලක්ෂණ වේ.» - ලෝ පතළ වාග්විද්‍යාඥ ආචාර්ය තෝව් ස්කුට්නැබ්-කන්ගස්*
*Dr. Tove Skutnabb-Kangas* - www.tove-skutnabb-kangas.org

එස්පෙරාන්තො වැනි මධ්‍යස්ථ භාෂාවකින් තාවකාලික ලෝක බලවතුන් නිර්මාණය වීමට ඇති ඉඩකඩ ඇහිරී යයි. වර්තමාන ලෝකයේ බලවතුන් ඉංගිරිසි කතා කරන රාජ්‍යයන් නිසා ඉංගිරිසි බසට ද බලයක් නිර්මාණය වී ඇත. මෙයට වසර 50කට පෙර ලෝක බලවතුන් වූයේ ඔවුන් නොවන අතර තවත් වසර 50කට පසු තත්ත්වය කෙබඳු වේද?

*«මව් බස කුමක් වුව ද සියල්ලන් ගේ ම අයිතීන් සුරකින එස්පෙරාන්තො භාෂාව කරන්නේ වැදගත් මෙහෙවරකි. » - ප්‍රකට වාග්විද්‍යාඥ ආචාර්ය රොබර්ට් ෆිලිප්සන්,*
Dr. Robert Phillipson - www.cbs.dk/en/staff/rpibc

- ***තාවකාලික ලෝක බලවතුන් පසුපස දිවීම නතර කරමු. ලෝකවාසී සියළු ජනතාවගේ සමානාත්මතාවය තහවුරු කිරීමට කලයයි මේ.***
- ***එම අරමුණ කරා යාමට මාර්ගය එස්පෙරාන්තො (Esperanto) භාෂාවයි.***


***Ŝri-Lanka Esperanto-Asocio***

*197, Indivitiya Road*

*Hettigama, Ja-Ela*

*Ŝri-Lanka*

*Zeiter Perera: zeiter.espero@gmail.com Phone: +94 77 221 16 51*


| | |
|---|---|
| | ***අන්තර්ජාතික එස්පෙරාන්තො සංගමය (UEA)***<br>***Universala Esperanto-Asocio (UEA)***<br>*www.uea.org* |

| | |
|---|---|
| | ***Linguistic Rights***<br>***www.linguistic-rights.org/esperanto-tago*** |

| | |
|---|---|
| | ***Esperanto en Ŝri-Lanko***<br>***www.linguistic-rights.org/srilanko*** |

| | |
|---|---|
| ***Information about***<br>***Esperanto, the International Language*** | ***එස්පෙරාන්තො, ජාත්‍යන්තර භාෂාව***<br>***எஸ்பெராண்டோ, சர்வதேச மொழி***<br>*www.esperanto.net* |

| | |
|---|---|
| ***lernu!*** free courses and information<br>on Esperanto, the living language useful<br>for easy communication. | *www.lernu.net* |

| |
|---|
| *The world's most popular way to learn **Esperanto** online, for free, **in just 5 minutes a day!*** |
| *https://en.duolingo.com/course/eo/en/Learn-Esperanto-Online* |


*Esperanto Day Posters: © Peter Oliver/UEA and translators from different countries*


*Text: UEA/ZPI - සිංහල පරිවර්තනය: දිනේෂ් හේමාල් (Dinesh Heymaal)*

*(ZPI: UEA, Department of Public Information - Stefano Keller)*

www.linguistic-rights.org/stefano-keller